කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව - 2022
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (1) (ඈ) (iii)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (i) (ඈ) (iv)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අදාල කාලයේ අනුපාත අනුව ස්ථාවර වත්කම් සඳහා රු.26,507,478 වු ක්ෂය වෙනුවට 37,276,334 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු. 10,771,856ක් වැඩියෙන් ක්ෂය ගිණුම්ගත කර තිබුණි. | පිළිගන්නා බව.2023 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වේ. |
| (ආ) | වර්ෂය තුළ නිම කරන ලද රු.5,376,828 ක් වටිනා ගොඩනැගිල්ලක් එම ගිණුම හර නොකර කෙරීගෙන යන වැඩ ගිණුම හරකර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාව විසින් ඉදිරිපත් කල විස්තර අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර 31 දිනට කපා හැරිය යුතු ණය ගැතියන් රු.4,653,925 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයක ගිණුම අනුව ශේෂය රු.9,998,590 ක් වුවත් ඊට අදාල උපයෝගී පොත්/උපලේඛන අනුව ශේෂය රු.9,951,054 ක් වුයෙන් ගිණුම හා උපයෝගී පොත්/උපලේඛන අතර රු.47,536ක වෙනසක් විය. | පිළිගන්නා බව. 2023 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 127 වගන්තිය ප්‍රකාර සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 3 වගන්තිය හා 128 වගන්තිය | සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමි 05ක සීමා නිර්ණයන් තීරණය කොට සභාවට පවරා ගෙන ගැසට් කිරීමට පියවර ගෙන නොතිබුණි. | සභාව සතු සුසාන භූමි සීමා නිර්ණයන් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, සභාව වෙත පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. අදාළ අනුමැතිය ලද විගස සභාව වෙත පවරා ගැනීමෙන් පසු ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව. | ගැසට් කිරීමේ කටයුතුද නොපමාව ඉටුකළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.67,206,396 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.75,111,696 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් විෂයය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කිරීම් | 2022 රැස්කල ආදායම | 2022 දෙසැ.31 දිනට සමුච්චිත හිඟ | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කිරීම් | 2021 රැස්කල ආදායම | 2021 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) වරිපනම් බදු | 69,331 | 50,221 | 50,087 | 55,201 | 60,000 | 53,428 | 43,050 | 60,673 |
| (ii) කුලී | 21,000 | 6,832 | 4,628 | 7,237 | 12,302 | 15,304 | 2,185 | 34,712 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,700 | 1,700 | 1,450 | 250 | 1,300 | 631 | 484 | 147 |
| (iv) වෙනත් ආදායම් | 23,481 | 23,481 | 25,200 | - | 4,235 | 3,422 | 3,422 | - |
| එකතුව | 115,512 | 82,234 | 81,365 | 62,688 | 77,837 | 72,785 | 49,141 | 95,532 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.62,327,863 ක් විය. | මෙම වරිපනම් හිග ශේෂ 09 තුළ රජයේ දේපල 02ක් ද, , නීතිමය කටයුතු සඳහා යොමු කරන ලද දේපල 01ක් ද, ඉතිරි දේපල සඳහා කොටස් වශයෙන් ශේෂ ගෙවීමට ද මේ වන විට එකගතාවය පළ කර ඇති බව. | වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පවතින හිඟ ආදායම් රැස්කිරීම කඩිනම් කළ යුතු වේ. |

(ආ) කඩ කුලී

| | | |
|---|---|---|
| සභාවට අයත් පැරණි වෙළඳ පොලෙහි පිහිටි කඩ කාමර **7** කින් හා වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර **109** කින් **2022** දෙසැම්බර් **31** දිනට පැවති හිඟ කඩ කුලිය රු. **25,303,157** ක් වූ අතර එයින් වර්ෂය තුලදී එකතු කළ ප්‍රමාණය රු.**3,495,288** ක් විය. | **2019** වසරේ නව කඩ කුලී ප්‍රතිශෝධනය කිරීම මත බදුකරුවන් මෙම කුලී ගෙවීම පැහැර හැර ඇත. **2021** දක්වා පැවති තක්සේරුව අනුව කුලී අය කිරීමටත් **2022** වර්ෂයේ කුලී තක්සේරුවෙන් **50%**ක මුදලක් අය කිරීමටත්, **2023** වර්ෂයේ සම්පූර්ණ කුලී තක්සේරුව අනුව කුලී අය කිරීමටත් මහ සභාව තීරණය කරන ලද බව. | කඩ කුලී ගෙවීම පැහැර හරින්නන්ගේ කඩ කාමර ආපසු පවරා ගැනීම වැනි විකල්ප ක්‍රම මගින් හිඟ කඩකාමර කුලී අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** වන දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.**11,020,280** ක් හා මුද්දර ගාස්තු රු.**266,867,232** ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුදුදර ගාස්තු උපලේඛන සකසා ඉදිරිපත් කර ඇති බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළයුතු වේ. |

**3** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොහිලවත්ත සුසාන භූමියේ ද්විත්ව ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම රු.**49,998,655** ක මුදලකට **2021** පෙබරවාරි මස **11** වෙනි දින අත්සන් කර තිබුණු අතර **2022** නොවැම්බර් **21** දින වන විටත් කර්මාන්තය සඳහා රු.**15,750,625** ක් ගෙවා තිබුණි. එහෙත් මිල විචලනයන් ඉල්ලීම් කර ව්‍යාපෘතියෙහි වැඩ නවතා දමා තිබුණි. ගිවිසුම් අනුව කර්මාන්තය සිදු කර නොතිබුන ද ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය මුදල වෙනුවෙන් සභාවට මාසිකව රු.**109,570** ක ණය වාරිකයක් ගෙවීමට සිදු වී තිබිණි. | **2022.11.21** වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.**15,750,624**ක් ගෙවා ඇත. අත්තිකාරම් ලෙස ගෙවා ඇති මුදල නැවත **2,518,911**, **1,958,380**, **653,510** හා **4,868,928** සභාව විසින් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ඇත. දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් පළමු ගෙවීම් වාර්තාව අනුව රු.**5,600,000**ක මුදලක් සභාව වෙත නිදහස් කරන ලදී. ඒ අනුව එම ණය මුදල සඳහා රු. **109,570** ක මුදලක් ණය වාරික ලෙස ගෙවීම් කරන බව. | ගිවිසුම් අනුව සාධාරණ වැඩිකිරීම්වලට සාකච්ඡා කර දෙපාර්ශවයම සම්මුතියකට එළඹී කඩිනමින් වැඩ නිම කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා සභාවේ ඉදිකිරීම්, කර්මාන්ත පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේදී ඉදිකිරීම්, කර්මාන්ත, පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට අපේක්ෂා කරන බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මුදල් ප්‍රතිපාදන ඇති කරගෙන අපේක්ෂිත කාර්යයන් සිදුකර නොතිබීම හෝ අවශ්‍ය නොවීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 18 ක රු.5,161,200 ක්ද මූලධන වැය විෂයයන් 11 ක රු.17,793,125 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 රාජ්‍ය වියදම් පාලනය කිරීමට උපදෙස් ලබා දුන් බව. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු වන අතර ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. |